# Legal Aspects & Procedures of Loan Process in Microfinance



**නීතිඥ උදය වේවැල්වල**

Attorney –at –Law, BSc Agric , Master of Development Studies, Accredited Trainer –CGAP, ADBI& TDLC, Frankfurt School of Finance and Management , ILO-SIYB



**නීතිඥ නිලූකා පි අබයරත්න**

Attorney –at –Law, Notary Public & commissioner for oaths

**Organized by**

Lanka Microfinance Practitioners' Association

# ක්ෂුද්‍ර මූල්‍ය ණය අය කිරීම සම්බන්ධ වත්මන් නිතිමය ප්‍රතිපාදන

- ගිවිසුම් නිතිය
- 1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනත
- විනිමය බිල්පත්‍ර ආඥා පනත :
- 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනත
- කාලාවරෝධ ආඥා පනත
- අසාධාරණ ගිවිසුම් නියම පනත

- ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත
- 1990 අංක 2 දරණ ණය ආපසු අයකරගැනිමේ ( විශේෂ විධි විධාන පනත)
- 1990 අංක 3 දරණ උකස් ( සංශෝධන ) පනත

UDAYA WEWELWALA & NILUKA ABEYARATNE

# ගිවිසුම් නීතිය

- **වලංගු ගිවිසුමක අත්‍යාවශ්‍ය අංග**

  1- අර්පනය ( offer )

  2- ප්‍රතිග්‍රහණය (acceptance )

  3- නෛතික සම්බන්ධතා ඇතිකිරීමේ චේතනාව

  4- සම්මුතියට අදාල උපචාර අනුගමනය කිරීම

  5- සාධාරණ හේතුව / අගනා ප්‍රතිෂ්ඨාව (causa / consideration)

  6- ගිවිසුම සඳහා පාර්ශවකරුවන්ගේ ශක්නුතාවය

    - බාලවයස්කරුවෙකු
    - මන්ද බුද්ධික පුද්ගලයෙකු
    - සිහිවිකල තැනැත්තෙකු
    - උමතු වුවෙකු
    - තේසවලාමේ නිතියට අදාල කාන්තාවක්

  7- අරමුණ නීත්‍යානුකුල වීම

UDAYA WEWELWALA & NILUKA ABEYARATNE

# වලංගු ගිවිසුමක් නැතිනම්

- නඩුව නිශ්ප්‍රභ වේ
- නඩුව හබ කිරීමට ලක්කරයි
- නඩුව අධික ලෙස කල් යයි
- ණයකරුගෙන් මුදල් අයකරවා ගැනිමට නොහැකි වේ

# සමථ මණ්ඩල පනත

- රුපියල් ලක්ෂ 5 කට අඩු සියළුම ණය ගණුදෙනු පිළිබදව අධිකරණයට යාමට ප්‍රතම සමථ මණ්ඩලයට යාම අනිවාර්ය වේ. නැතිනම් නඩුව නිශ්ප්‍රභ වේ.
- සමථ මණ්ඩලයට රුපියල් 5/- ක මුද්දරයක් අලවා ඉල්ලිම් ලිපියක් ඉදිරිපත් කල යුතුය.
- එහිදි නිරවුල් කිරිමේ සහතිකය හෝ නිරවුල් නොකිරිමේ සහතිකය ලබාගත යුතුය.
- මුදල් ගෙවන්නේ නම් අඩු වියදමකින් මුදල් අයකරවා ගත හැක.

# විනිමය බිල්පත්‍ර පනත

- වචන කපා දැමූ, ටිපෙක්ස් කරන ලද, මකා දමන ලද, පොඩිවන ලද, ඉරුනු චෙක්පත් හෝ පොරොන්දු නෝට්ටු මත මුදල් අයකරවා ගත නොහැක. නඩුව නිශ්ප්‍රභ වේ.
- කල් ඉකුත් වූ ලේඛන මතද ණය අයකරවා ගත නොහැක.
- දිවුරුම් ප්‍රකාශයක් පැමිණිල්ල සමග ගොනුකර නොතිබුනහොත් නඩුව නිශ්ප්‍රභ වේ.

# මුද්දර ගාස්තු පනත

- පොරොන්දු නෝට්ටුව- 1000:1
- දිවිරුම් ප්‍රකාශය- රුපියල් 50

# මුද්දර ගාස්තු නොගෙව්වොත්

- නඩුව නිශ්ප්‍රභ වේ /
- දඩ මුදල් ගැසිමට සිදුවේ /
- නැවත මුල සිට ආරම්භ කිරිමට සිදුවේ/
- නඩුව අධික ලෙස කල්ගත වීම සිදුවේ
- ණයකරුට නඩුව දිනිමට විත්තිවාචකයක් ලබාදීමක් වැනිය
- නඩුව හබ කිරිමක් සිදුවිය හැක. සමථ වීමක් සිදුනොවිය හැක.
- ආයතනයට මුදල් අයකරගැනිමට නොහැකි වේ.

# කාලාවරෝධී ආඥා පනත

- උකසක් හෝ ණය ගිවිසුමක් - අවුරුදු 6 - උකස් සාධන පත්‍රයේ දින සිට හෝ අවසාන පොලිය ගෙවූ හෝ කොන්දේසිය කඩ කල දින සිට
- පොරොන්දු නෝට්ටු -අවු 6
- විනිමය බිල්පත්‍ර - අවු 6

# කල් ඉකුත් වී නඩුවක් පැවරුවොත්

- නඩුව නිශ්ප්‍රභ වේ
- නැවත නඩුවක් පැවරිය නොහැක
- මුදල් අයකරවා ගැනිමට නොහැක
- නිතිමය සහන ලබාගත නොහැක

# සිද්ධි අධ්‍යයනය

- චතුර XYZ ආයතනයේ ක්ෂුද්‍ර මූල්‍ය නිලධාරියෙකි. ඔහු සිරියාවතිට ණය මුදලක් ලබාදෙන අවස්ථාවේදි ඇයගෙන් ණය ගිවිසුමකට අත්සන් ලබාගන්නා ලදි. ඔහු ණය ගිවිසුමෙහි හිස්තැන් පිරවීමේදි කොටසක් පමණක් පුරවා සිරියාවතිගෙන් අත්සන් ලබාගෙන ඇත. චතුර මාස 3 ක් පමණක් එම ආයතනයේ රැකියාව කර ඉන් අස් වන ලදි. චතුර මහතා ණය එකතු කිරිමට නොපැමිණිම නිසා සිරියාවති ණය ගෙවීම පැහැර හරින ලද්දේ හිතාමතාමය. ණය ගිවිසුමේ ඉතිරි හිස්තැන් එකි ආයතනයේ ලිපිකාරිනිය විසින් පුරවා නීතීඥ මහත්මාට ලබා දි ඇත. මෙම ණය ගිවිසුම අධිකරණ ක්‍රියාවලියකදි කුමන ආකාරයෙන් බලපානු ලැබිය හැකිද?

# ණය ලබාදීමේදි අත්සන් කරනු ලබන ලේඛන සහ ණයකරුගෙන් ලබාගත යුතු ලේඛන

- ණය ගිවිසුම
- ඇප ගිවිසුම
- පොරොන්දු නෝට්ටු

- ණයකරුගේ ජාතික හැදුනුම්පතේ  පිටපතක්
- දිවිරුම් ප්‍රකාශ
- වත්කම් බැරකම් ප්‍රකාශ
- ග්‍රාම නිලධාරි සහතික
- විදුලි බිල්පත්
- ණයකරුගේ වැටුප් විස්තරය
- සේවා ස්ථානයෙන් ලබාගත් සහතිකය
- ඇපකරුවන්ගේ ජාතික හැදුනුම්පත් හි ජායාපිටපත්

# ණය ගිවිසුමේ පවතින වැදගත් අංග

- ණයකරුගේ සහ ණයහිමිගේ සම්පූර්ණ නම්
  ලිපිනයන් ජාතික හැඳුනුම්පත් අංක
- ගිවිසුමට එළඹෙන දිනය සහ ස්ථානය
- මුදල් ආපසු ගෙවන ආකාරය-  වාරිකය, පොළි ප්‍රතිශතය, වාරික ගණන
- ණයවාරික ගෙවනු ලැබිය යුතු ස්ථානය
- නියමිත ආකාරයට නොගෙවනු ලැබුවහොත් අයකරන දඩ පොළිය
- ණය නොගෙවනු ලැබුවහොත් අධිකරණයට යන බවට ඇති එකගතාවය
- ණයකරුගේ අත්සන සාක්ෂිකරුවන්ගේ අත්සන් සහ සාක්ෂිකරුවන්ගේ නම ලිපිනය ජාතික හැඳුනුම්පත් අංකය

# ණය ගිවිසුමේ එම අංග නඩුවට බලපාන ආකාරය

- අධිකරණ බලය තීරණය කිරීමට
  - ගිවිසුමට එළඹුන ස්ථානය
  - ණය මුදල් වාරික ගෙවන ස්ථානය
  - ණයහිමිගේ / ණයකරුගේ ලිපිනය
- නඩු නිමිත්තක් ඇතිවී ඇත්ද? යන්න තිරණය කිරීමට

ගිවිසුමට එළඹුන දිනය/ වාරිකයේ ප්‍රමාණය/ වාරික ගණන

- නඩුව කාලාවරෝධ වී ඇත්ද? තිරණය කිරීමට

ගිවිසුමට එළඹුන දිනය/ ණය වාරික ගෙවීම අත්හරින ලද දිනය

- වලංගු ණය ගිවිසුමක්ද? යන්න තිරණය කිරීමට

ණයකරුගේ අත්සන/ ජාතික හැදුනුම්පත් අංකය/ සාක්ෂිකරුවන්ගේ අත්සන් සහ ජාතික හැදුනුම්පත් අංකය ණය ගිවිසුමට එළඹීමේ අරමුණ

# ඇප ගිවිසුමේ පවතින වැදගත් අංග

- ඇපකරුවන්ගේ සම්පූර්ණ නම්/ ලිපින / ජාතික හැඳුනුම්පත් අංක
- ඇපවන්නේ කාගේ ණය මුදලක් සම්බන්ධවද යන්න සහ ඇපවන මුදල් ප්‍රමාණය සහ ඊට අදාල පොළිය
- ඇපකරුගේ අත්සන් සනාථ කිරීම සඳහා අදාල සාක්ෂිකරුවන්ගේ නම් / ලිපින/ ජාතික හැඳුනුම්පත් අංක
- ගිවිසුමට එළඹුන දිනය
- මුද්දර අලවා තිබීම

UDAYA WEWELWALA & NILUKA ABEYARATNE

# ඇප ගිවිසුමේ පවතින වැදගත් අංග නඩුවට බලපාන ආකාරය

- නඩුවේ  විත්ති සිතාසි ඇපකරුවන් වෙත යැවීමට
  ඇපකරුවන්ගේ සම්පූර්ණ නම්/ ලිපිනයන්
- ඇපකරුවන්ට විරුද්ධව නඩු නිමිත්තක් පැන නැගි ඇත්ද? තිරණය කිරීමට
  ණයකරු ණය ගෙවීමට අපොහොසත් වුවහොත් එකි මුදල ගෙවන බවට වු පොරොන්දුව
- ඇප ගිවිසුම වලංගු ගිවිසුමක් බව ඔප්පු කිරීමට
  ඇපකරුවන්ගේ අත්සන්/ දිනය / සාක්ෂිකරුවන්ගේ අත්සන/ දිනය/ මුද්දර අලවා තිබීම

# පොරොන්දු නෝට්ටුවේ පවතින වැදගත් අංග

- ණයහිමිගේ / ණයකරුගේ සම්පූර්ණ නම්/ ලිපිනයන්/
- ගිවිසුමට එළඹුන දිනය / ස්ථානය
- ණයකරුගේ අත්සන/ ඇඟිලි සලකුණ
- මුද්දර ගාස්තු අලවා තිබීම
- පොළී ප්‍රතිශතය
- ණය මුදල
- සාක්ෂිකරුවන්ගේ අත්සන්/ නම/ ලිපින/ ජාතික හැඳුනුම්පත් අංක

UDAYA WEWELWALA & NILUKA ABEYARATNE

# පොරෝන්දු නෝට්ටුවේ පවතින අංග නඩුවට බලපාන ආකාරය

- අධිකරණ බලය තිරණය කිරීමට

  ගිවිසුමට එළඹුන ස්ථානය/ ණයකරුගේ පදිංචිය

- නඩු නිමිත්ත ඔප්පු කිරීමට

  ණය මුදල/ දිනය/ ණයකරුගේ අත්සන

- වලංගු ගිවිසුමක්ද? යන්න තිරණය කිරීමට

  මුද්දර අලවා තිබීම/ ණයකරුගේ අත්සන්/ සාක්ෂි අත්සන්/දිනය

# පොරොන්දු නෝට්ටුව මත ණය අයකරගැනිමට නොහැකි අවස්ථා

- පොරොන්දු නෝට්ටුවේ අකුරු කපා කොටා ඇත්නම්
- ටිපෙක්ස් කර ඇත්නම්
- මකා දමා ඇත්නම්
- ණයකරුගේ අත්සන පැහැදිලි නැත්නම්/ අත්සන ප්‍රතික්ශේප කරයිනම්
- පොරොන්දු නෝට්ටුව පොඩිවි ඇත්නම්
- ඉරුනු ලද සලකුණු ඇත්නම්

# වත්කම් පිළිබඳ දිවුරුම් ප්‍රකාශයේ වැදගත් අංග

- ණයකරුගේ සම්පූර්ණ නම/ ලිපිනය/ දිනය
- ණයකරුගේ ආගම
- රුපියල් 50/- මුද්දරයක් අලවා තිබීම
- ණයකරුගේ සියළුම වත්කම් පිළිබඳව විස්තර කර තිබීම සහ එම වත්කම් දේපල සදහා ඇපයට තැබීමක් සිදුවන බවත් ණය නොගෙවීමකදි එකී දේපල වෙන්දේසි කර ගත හැකි බවත්

# වත්කම් පිළිබඳ දිවිරුම් ප්‍රකාශය නඩුවේදි වැදගත් වන ආකාරය

- නඩුවේ තින්දුව ක්‍රියාත්මක කරවා ගත යුතු ආකාරය අධිකරණයට දැනුම් දිමට සහ ණය මුදල පහසුවෙන් අයකරවා ගැනිමට ඉතාමත් වැදගත් වේ

UDAYA WEWELWALA & NILUKA ABEYARATNE

# පවුලේ ඇප ප්‍රකාශය

- පවුලේ සාමාජිකයා විසින් ලබාගන්නා ලද ණය මුදල පිළිබදව දැනුවත් බවත් එකී ණය නොගෙවීමකදි එම ණය මුදල ගෙවීමට භාරගන්නා බවත් ප්‍රකාශ කරයි
- ඇපකරුගේ අත්සන සහ දිනය වැදගත් වේ

# පවුලේ ඇප ප්‍රකාශයේ වැදගත් කම

- නඩුවකදි ඔහුවද ඇපකරු වශයෙන් නම් කර ණය මුදල ගෙවාලිමට පෙළඹවිය හැක (If signed a legally accepted guarantee agreement)
- දේපල වෙන්දේසියකදි ඔහුට අයත් දේපලද වෙන්දේසි කල හැක

# ඉහත කි ගිවිසුම් වල දෝෂයන් / අඩුපාඩු තිබුනහොත් සිදුවිය හැකි දේ

- නඩුව නිශ්ප්‍රභ විය හැක
- මුදල් අයකරවා ගත නොහැක
- ණයකරු සහ ඇපකරුවන් මුදල් ගෙවීම ප්‍රතික්ශේප කල හැක
- කාලය ගත වේ
- ඔප්පු කිරීම සදහා වෙනත් පරිවේශනිය සාක්ෂි යොදාගැනිමට සිදුවේ

ඒ බී සි ආයතනය විසින් සිරියාවතිට එරෙහිව නඩු පැවරීමට තිරණය කර ඇත. ඒ සඳහා ක්ෂුද්‍රමූල්‍ය නිලධාරි යොහාන් නිතිඥවරයාව හමුවීමට ගොස් පැමිණේ ආයතනයේ අධ්‍යක්ෂක සහ යොහාන් අතර ඇතිවූ කතාබහකි

- අධ්‍යක්ෂක- යොහාන් කොහොමද? සිරියාවතිගේ නඩුව පවරලාද?
- යොහාන් - තවම නැහැ
- අධ්‍යක්ෂක- ඇයි ඒ
- යොහාන් - සමට මණ්ඩලයේ සහතිකය නැතිව නඩු පවරන්න බැ කියලා කිව්වා තව ආයතනයෙන් ලෝයර් කෙනෙක් මගින් එන්තරවාසි දාලා නැති නිසා ඒක මුලින්ම දාලා දින 14 ක් බලන්න වෙනවා කියලාත් කිව්වා
- අධ්‍යක්ෂක- එහෙනම් තවත් කල් යයි නඩුව දාන්න මේ සම්බන්ධව අපි කරුණු සොයාබලා අපේ අඩුපාඩු හදාගන්න ඕන. නැත්නම් මේ නඩුව දාන්න තවත් කල් යාවි.

**ප්‍රශ්ණය- නඩු පැවරීමේ පියවර සාර්ථක කර ගැනිම සඳහා ආයතන වෙතින් සිදුකල යුතුව තිබූ කරුණු මොනවාද?**

# ණය අයකරවා ගැනීමේ ප්‍රාථමික ක්‍රියාවලිය

- ණයකරු ගෙන්වා ණයමුදල ගෙවීම සඳහා පොළඹවා ලීම
- ඇපකරුවන්ට ණයමුදල ගෙවීම සඳහා බලපෑම් කිරීම
- ආයතනය විසින් ණය ගෙවන ලෙස දන්වා යවන ලිපි
- සමථ මණ්ඩලයට පැමිණිලිකිරීම
- නීතිඥවරයෙකු මගින් එන්තරවාසි ණයකරුට සහ ඇපකරුවන්ට යැවීම

# ණයකරු පොළඹවාලන ආකාරය

- නියමිත දිනයට ණය නොගෙවීමෙන් දඩ පොළියක් ගෙවීමට සිදුවන බව
- නැවත වෙනත් කිසිදු ආයතනයකින් ණය මුදලක් ලබාගැනිමට නොහැකි වන බව ( ක්‍රිබ් එකට ඇතුලත් කිරීමෙන් )
- ඇපයට තබා ඇති දේපල අහිමි වන බව
- ඇපකරුවන්ට විරුද්ධවද නඩු පවරන බව
- නඩු ගාස්තු, නිතීඥ ගාස්තු වශයෙන් අධික මුදලක් ගෙවීමට සිදුවන බව
- අවසානයේ අත්අඩංගුවට ගත හැකි බව

# සමථ මණ්ඩලය

- ඉල්ලීම් ලිපියක් මගින් ඇයදිම කල හැක
- ඉල්ලිම ලියාපදිංචි තැපැලෙන් වුවද කල හැක
- ඉල්ලිමේ ලිපියට රුපියල් 5/ක මුද්දර එකක් ඇලවිය යුතුය
- වාර 2 කින් පසුව නිරවුල් නොකිරීමේ සහතිකයක් ලබාගත හැක. එය දින 60 ක් ඇතුලත ලබාදිය යුතුය
- සමථ මණ්ඩලයේ නිලධාරීන් හරහා බලපෑම් කර ණය අයකරවා ගැනිමට කටයුතු කල හැකිය
- එවිට නිරවුල් කිරීමේ සහතිකයක් ලබාගත හැකි අතර මුදල් සමථ මණ්ඩලයේදි ලබාගත හැක
- අඩු වියදමකින් සහ අඩු කාලයකින් මුදල් අයකරවා ගැනිමට හැකි ක්‍රමවේදයකි

# ඵන්තරවාසි යැවීම

- ණයකරුට සහ ඇපකරුවන්ට ලියාපදිංචි තැපැලෙන් ඵන්තරවාසි නිතිඥවරයෙකු මගින් යැවිය යුතුය
- අදාල තැපැල් භාණ්ඩ කුවිතාන්සිය ළග තබාගත යුතුය
- ණයකරුට සහ ඇපකරුවන්ට පැමිණෙන ලෙස දන්වා ණය ගෙවීමට නීතිඥවරයෙකු මගින් බලපෑම් කල යුතුය

# එන්තරවාසි නොදැම්මොත් මොකද වෙන්නේ

- කෙටි කාලයකින් ණය මුදල් අයකරවා ගැනිමට ඇති අවස්ථාව අහිමි වෙනවා
- සමථයකට ඇති අවස්ථාව අහිමි වෙනවා
- අධිකරණ ක්‍රියාමාර්ගය අසාර්ථක වෙනවා
- ණයකරුට සහ ඇපකරුවන්ට හොද විත්තිවාචකයක් ලබාදීමක් වෙනවා

# සිද්ධි අධ්‍යයනය

**අමරා** - මොනවද කමලා පොල්ගහ අස්සේ හැංගිලා එබිකම් කර කර බලන්නේ

**කමලා**-මම සි ඇන්ඩ් බි ආයතනයෙන් ණයක් ගත්තා. මට ගෙවාගන්න බැරිවුන නිසා දැන් නඩුදාලා. ඔය ඇවිල්ලා ඉන්නේ උසාවියේ මහත්තයෙක්.

**අමරා**- කොහොමද? නඩු දාලා කියලා දැනගත්තේ

**කමලා**- මට මුලින්ම තැපැලෙන් ලේඛන වගයක් ආවා. ඒකෙන් දැනගත්තේ. ඊට පස්සේ ඒ කඩදාසි ටිකත් මම අරගෙන පෙරකදෝරු මහත්තයෙක් හම්බවෙන්න ගියා.

**අමරා**- ඉතින් ඊට පස්සේ

**කමලා**- මගේ නැතිබැරිකම් ටික මම ඒ මහත්තයාට කිව්වා. ඉතින් ඒ මහත්තයා මට කිව්වා බය නැතුව ඉන්න. නඩුව කල්දාලා දෙන්නම් සිතාසි ගන්න එක මගහරින්න කියලා. මම නඩුවට නොගියට විස්තර ටික මට ඒ මහත්තයා කියනවා. දැන් නඩු වාර 4 ක් ම ගියා. ඒත් සිතාසි මට භාරදෙන්න ඒ උසාවියේ මහත්තයාට බැරුව ගියා

**ප්‍රශ්නය- අමරාට සිතාසි භාරදිම සඳහා ඔබට ගතහැකි පියවරයන් මොනවාද?**

UDAYA WEWELWALA & NILUKA ABEYARATNE

# නඩුවක පියවරයන්

1. නඩුව ගොනුකිරීම ( පැමිණිල්ලේ නිතිඥ විසින් ගොනුකිරීම සිදුකරයි )
2. නඩුව විවෘත අධිකරණයේ කැදවීම ( මේ වන විට විත්තිකරුවන්ට සිතාසි ලියාපදිංචි තැපැලෙන් අධිකරණය යවා ඇත) විත්තිකරු පැමිණියේ නම් පෙරකලාසියක් ඉදිරිපත් කරමින් නිතිඥ වරයෙකු විත්තිකරුවන් වෙනුවෙන් පෙනිසිටි. තවද විත්තියේ නිතිඥ විසින් උත්තරක් ඉදිරිපත් කිරීම සදහා දිනයක් ලබාදෙන ලෙස ඇයද සිටි.
3. නඩුව විවෘත අධිකරණයේ කැදවන දෙවන දිනයයි. මෙහිදි විත්තිකරුගේ නිතිඥ විසින් උත්තරයක් ඉදිරිපත් කරයි. හරස් ඉල්ලිමක් උත්තරයේ ඇත්නම් ප්‍රතිඋත්තරය සදහා පැමිණිල්ලෙන් දින ඇයද සිටි.
4. නඩුව විවෘත අධිකරණයේ කැදවන 3 වන දිනය වේ. එහිදි ප්‍රතිඋත්තරය ගොනුකරයි. උසාවිය විසින් මෙදින නඩු විභාගයට දින ලබාදේ.
5. නඩු විභාගයට දින 15 කට ප්‍රථම ලේඛනාගාරයට නඩුවේ පිළිගැනිම් විසදිය යුතු ප්‍රශ්ණ සාක්ෂි සහ ලේඛන ලැයිස්තුව විරුද්ධපාර්ශවයට දැන්විම් සහිතව ලබාදිය යුතුය. ( දෙපාර්ශවය විසින්ම කල යුතුය ) ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සියද අමුණන්න

UDAYA WEWELWALA & NILUKA ABEYARATNE

# නඩුවක පියවරයන්

6. **නඩු විභාග දිනයයි** - පිළිගැනීම් සහ විසඳිය යුතු ප්‍රශ්ණ ස්ථිරකිරීම සහ හෝ එයට යම් විසඳිය යුතු ප්‍රශ්ණ එකතු කිරීම/ විසිඳිය යුතු ප්‍රශ්ණ කපා දැමීම හෝ මෙහිදි සිදුවේ

7. **නඩු විභාග දිනයේ 2 වන දිනය** - පැමිණිල්ලෙන් සාක්ෂි මෙහෙය වීම සිදුකරයි එහිදි පැමිණිල්ල සතුව පවතින සියළුම ලේඛන සාක්ෂි මෙහෙයවීමේදි පැ 1 සිට ලකුණු කරයි. එකී ලේඛන සඳහා විනිසුරුතුමන්ගේ අත්සන ලබාගත යුතුය.

8. **නඩු විභාගයේ 3 වන දිනය** - විත්තියේ සාක්ෂි මෙහෙය වීම සිදුකරයි. එහිදි විත්තිය සතුව පවතින සියළුම ලේඛන වි 1 සිට ලකුණු කිරීම සිදුකරයි.

9. **නඩු වභාගය අවසන් කරයි** එහිදි උසාවිය විසින් ලිඛිත දේශන ගොනුකිරීම සඳහා දින ලබාදේ. මෙහිදි සිදුවන්නේ නඩු විභාගයේදි සාක්ෂි වලින් හෙලිදරව් කරන ලද වැදගත් සාක්ෂි කොටස් උපුටා දක්වමින් තම තමන්ගේ මතය ප්‍රකාශ කරමින් පැමිණිල්ලෙන් හෝ උත්තරයෙන් ඇයද ඇති සහනයන් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමයි. මෙහිදි ලකුණු කරන ලද සියළුම ලේඛන උසාවියට භාරදීම සිදුකල යුතුය

10. **ලිඛිත දේශන සහ අදාල ලේඛන සැලකිල්ලට ගනිමින් තීන්දුව ලබාදේ**

UDAYA WEWELWALA & NILUKA ABEYARATNE

# නඩුවක් අසාර්ථක වීමට බලපාන කරුණු

UDAYA WEWELWALA & NILUKA ABEYARATNE

සෙව්වන්දි සහ මේනකා ඒ බී සි ආයතනයෙන් ණය ලබාගන්නා ලද කණ්ඩායම් සාමාජිකාවන් දෙදෙනෙකි ඔවුන් අතර ඇතිවූ කතාබහකි

- **සෙව්වන්දි-** අද නඩුවට මොකද වුනේ
- **මේනකා-** අදත් නඩුව කල්ගියා
- **සෙව්වන්දි-** ඒ මොකද?
- **මේනකා-** අපේ පෙරකදෝරු මහත්තයා කිව්වා පැමිණිල්ලට හොම්බෙන් යන්නම වැඩේ දෙන්නම් කියලා අද අපේ උත්තරය උසාවියට දැම්මා. නඩුව විසිකරන්න වෙන විදියට කරුණු දැම්මා කියලා කිව්වා. පැමිණිල්ලේ නිතිඥ මහත්තයා ඒකට විරුද්ධව උත්තර බදින්න ඕන කියලා තමයි නඩුව කල් ගියේ

ප්‍රශ්ණය- නඩුවකදි ණයකරුට උත්තරයෙන් ඉදිරිපත් කල හැකි කරුණු මොනවාද?

අමරසිංහ මහතා ඩි ඒ මයික්‍රො ක්‍රෙඩිට් ආයතනයේ අධ්‍යක්ෂක වන අතර ඔහු ඉතිරිකරගත් මුදලින් මෙම සමාගම පිහිටුවා පුද්ගලයන්ට ණය ලබාදිම සිදුකරන ලදි. බොහෝ පුද්ගලයින් ණය නොගෙවා පැහැර හැරීම හේතුවෙන් ඔවුන්ට විරුද්ධව නඩු පැවරීමට තිරණය කරන ලදි. අද එකි නඩුව පූර්ව නඩු විභාගයට කැදවන දිනයයි.

- **ණයකරුගේ නිතිඥ-** ස්වාමිනි අද පූර්ව නඩු විභාග දිනය. පැමිණිලිකරුගේ සාක්ෂි සහ ලේඛන ලැයිස්තුව අප වෙත ලැබුනේ නැහැ ස්වාමිනි. ඒ වගේම පැමිණිලිකරුගේ විසදිය යුතු ප්‍රශ්ණ සහ පිළිගැනිම් ද අප වෙත ලැබුනේ නැහැ ස්වාමිනි.
- **පැමිණිලිකරුගේ නිතිඥ** - මා විසින් ගොනුකරලා තිබෙන්නේ ස්වාමිනි.
- **ණයකරුගේ නිතිඥ-** කවදද ගොනුකලේ
- **පැමිණිලිකරුගේ නිතිඥ** - මිට දින 2 කට ප්‍රතම තමයි ස්වාමිනි ලේඛන ගොනුකලේ
- **ණයකරුගේ නිතිඥ-** නඩු විභාගයට දින 15 කට ප්‍රතම අදාල ලේඛන ගොනුකර නොමැති හෙයින් මා එකි ලේඛන පිළිගැනිම සම්බන්ධයෙන් විරුද්ධ වෙනවා ස්වාමිනි

සුමුදු ක්ෂුද්‍ර මූල්‍ය නිලධාරියෙක් වන අතර ණයඅයකරගැනිමේ නඩුවට ඔහුට පෙනිසිටිමේ බලය එන් කේ ආයතනය විසින් ලබාදි තිබුණි. නිතිඥ වරයා සහ සුමුද අතර සිදුවුන කතාබහකි මේ.

- නිතිඥ- අද නඩු විභාග දිනය. ඇයි කලින් ආවේ නැත්තේ මාව හමුවන්න.
- සුමුද- ආයතනයේ වැඩ හරියට. වෙලාවක් තිබුනේ නැහැ සර්ව හමුවන්න
- නිතිඥ - හොදයි දැන් මම අහන ප්‍රශ්ණ වලට උත්තර දෙන්න බලන්න. ප්‍රශ්ණ අසයි-----
- සුමුදු- අනේ සර් ඒක ගැන කියන්න මම දන්නේ නැහැ ආයතනයේ එකවුන්ටන්ගෙන් තමයි සර් ඒ ගැන අහන්න ඕන. මට ඕවා ඔල්මොරොන්දම් වගේ. මේ ලෝකේ දෙයක් තේරෙන්නේ නැහැ.
- නිතිඥ- ණය ගෙවපු ආකාරය සදහන් ලේඛන ගෙනාවද?
- සුමුදු - අනේ සර් මට හදිසියට ඒ ලේඛනත් ගේන්න බැරිවුනානේ
- නිතිඥ- මේ විදියට උත්තර දෙන්න ගියොත් අපි නඩුව පරදිනවා. මගේ ජුනියර් ලෝයර් කෙනෙක්ව යවලා පුද්ගලික හේතු මත දිනයක් ගමු වෙන කරන්න දෙයක් නැහැ.

**ප්‍රශ්ණය - නඩුව කල්යාම වලක්වාගැනිම සදහා ආයතනය පැත්තෙන් කලහැකිව තිබු දේවල් මොනවාද?**

UDAYA WEWELWALA & NILUKA ABEYARATNE

## නුවන් ඒ බී සි ආයතනයේ නඩු වලට අධිකරණයේ පෙනී සිටින නිලධාරියා වේ. අද නඩු විභාග දිනයයි පැමිණිලිකරුගේ නිතිඥ සාක්ෂි මෙහය වීම සිදුකරයි

- පැමිණිල්ලේ නිතිඥ - ස්වාමිනි විත්තිකරු ඒ බී සි ආයතනයෙන් ණය මුදල ලබාගැනිමේදි ණය ගිවිසුමකට අත්සන් තබා තිබෙනවා මම එකි ලේඛනය මේ අවස්ථාවේදි පැ 1 වශයෙන්ද ඇප බැදුම්කරය පැ 2 වශයෙන් ද පොරොන්දු නෝට්ටුව පැ 3 වශයෙන්ද ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා
- විත්තියේ නිතිඥ - ඔප්පු කිරිමේ භාරයට යටත්ව ලේඛන ලකුණු කිරිමට ඉල්ලා සිටිනවා
- පැමිණිලිකරුගේ නිතිඥ- විත්තිකරුට සහ ඇපකරුවන් දෙදෙනාට යවන ලද එන්තරවාසි 2 පැ 4 සහ පැ5 වශයෙන්ද ඊට අදාල තැපැල් භාණ්ඩ කුවිතාන්සිය පැ 5 ( අ) වශයෙන් ද ලකුණු කිරිමට අවසර ඉල්ලා සිටිනවා
- විත්තියේ නිතිඥ - එකි ලේඛන ලකුණු කිරිම සම්බන්ධයෙන් මා විරුද්ධ වෙනවා ස්වාමිනි එකි ලේඛන පැමිණිලිකරුගේ සාක්ෂි සහ ලේඛන ලැයිස්තුව තුල අන්තර්ගත වෙලා නැහැ ස්වාමිනි
- උසාවියෙන් - සාක්ෂි සහ ලේඛන ලැයිස්තුව තුල නොමැති ලේඛනයක් ලකුණු කිරිමට අවසර ලබාදෙන්නේ නැහැ
- නුවන්- සර් ඒ ලේඛන නඩුවට ආයේමත් ගොනුකරන්න බැරිද?
- නිතිඥ- සාක්ෂි සහ ලේඛන ලැයිස්තුව ගොනුකරන්න කලින් ඒ ලේඛන මට ගෙනත් දෙන්න කියලා කිව්වේ ඒක තමයි. දැන් ඉතින් හතරවරං දෙවිවරු වැඩියත් ඔය ලේඛන උසාවියට ගොනුකරන්න බෑ
- නුවන්- ඉතින් නඩුවට මොකක් වෙයිද? සර්
- නිතිඥ - සමහර නඩු තින්දු තියෙනවා එන්තරවාසි යවන්නේ නැතිව ණයකරුගෙන් සහ ඇපකරුවන්ගෙන් ණයඅයකරගැනිමට අපහසුයි කියලා.

**ප්‍රශ්ණය- මෙමගින් මතුවිය හැකි ගැටළු මොනවාද? එය වලක්වාගැනිම සදහා ආයතය මගින් කල හැකිව තිබු දේවල් මොනවාද?**